*සැ. යු.* - 2023.11.24 දින පළ වූ අංක 2360 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,361 - 2023 දෙසැම්බර් මස 01 වැනි සිකුරාදා - 2023.12.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 3060 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.*- (i) මලෙයහ ශිෂ්‍ය උසස් අධ්‍යාපන අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2023 නොවැම්බර් මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) වත්නි මත් පුණ්‍යායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2023 නොවැම්බර් මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 දෙසැම්බර් මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 දෙසැම්බර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2023 (විවෘත)

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අදාළ සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුර* | *මාසික වැටුප් පරිමාණය* | *අදාළ අමාත්‍යංශය* | *පුරප්පාඩු* |
|---|---|---|---|---|
| 01 | III පන්තියේ II ශ්‍රේණියේ බඳු නිලධාරී | MN - 5 - 2016<br>රු. 34,605-660x10-755x11-930x15-රු. 63,460/- | | 15 |
| 02 | ක්‍රීඩා නිලධාරී - III | MT-2 - 2016<br>රු. 30,140-350x10-370x11-560x10-660x10-රු. 49,910/- | බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යංශය | 02 |
| 03 | පරිවාස නිලධාරී - II | MN-5 - 2016<br>රු. 34,605-10x660-11x755-15x930-රු. 63,460/- | බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යංශය | 03 |
| 04 | පුස්තකාලයාධිපති - III | MN - 3 - 2016<br>රු. 31,040-445x10-660x11-730x10-750x10-රු. 57,550/- | බස්නාහිර පළාත් පාලන අමාත්‍යංශය | 07 |

03. *සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

(ii) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් පත් කරනු ලබන දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් ව මෙම සේවයට පත් කරනු ඇත.

(iii) තනතුරට බඳවා ගැනීමෙන් පසු තනතුරට අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ හෝ සේවා ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගවලින් සමත් විය යුතුය.

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට *නොහොත්* නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

(v) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයේ නම ඇතුළත් විය යුතුය.)

04. *පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :*

ඉහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2023.12.10** දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් **2023.12.10** දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

05. *සුදුසුකම් :*

| *තනතුර* | *සුදුසුකම්* |
|---|---|
| III පන්තියේ II ශ්‍රේණියේ බඳු නිලධාරි | (*අ*) ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම *හෝ* වරලත් ගණකාධිකාරී ආයතනයේ මධ්‍ය පරීක්ෂණයෙන් සමත් වීම, ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය හෝ වාණිජ විද්‍යාව පිළිබඳ හෝ ඩිප්ලෝමා පාඨමාලාවේ මධ්‍ය පරීක්ෂණය සමත් වීම.<br><br>(*ආ*) වයස අවුරුදු 30ට අඩුවීම. (දැනටමත් රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාළ නොවේ.)<br><br>(*ඇ*) පහත පරිදි අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ද්විතීය භාෂාවකින් සාමාර්ථයක් ලබා තිබීම.<br><br>සිංහල මාධ්‍යයෙන් පෙනී සිටි අයදුම්කරුවන් - දෙමළ හෝ ඉංග්‍රීසි විෂය<br>දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටි අයදුම්කරුවන් - සිංහල හෝ ඉංග්‍රීසි විෂය<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටි අයදුම්කරුවන් - සිංහල හෝ දෙමළ විෂය<br><br>*විභාගය පිළිබඳ විස්තර :*<br><br>*ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය* \| *කාලය* \| *මුළු ලකුණු* \| *සමත් ලකුණු*<br>1. බුද්ධි පරීක්ෂණය \| පැය 01 \| 100 \| 40%<br>2. සාමාන්‍ය දැනීම \| පැය 01 \| 100 \| 40%<br><br>■ ප්‍රශ්න පත්‍ර දෙක සඳහා සාමාන්‍ය ලකුණු 50ක් ලබාගත යුතු ය. |
| ක්‍රීඩා නිලධාරි III | *ක්‍රීඩා නිලධාරි අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*<br><br>(*අ*) I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම ;<br><br>*සහ*<br><br>II. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් සඳහා සාමාර්ථ ලබාගෙන තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) ;<br><br>*සහ*<br><br>III. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් (දිස්ත්‍රික් අතර) පැවැත්වෙන තරගයන්හි දී 1 හෝ 2 ස්ථානයන් ලබා තිබීම, ජාතික මහා ක්‍රීඩා උළෙලේ 1, 2 හෝ 3 ස්ථානයන් ලබා තිබීම, ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරගවල 1, 2 හෝ 3 ස්ථානයක් ලබා තිබීම ;<br><br>*හෝ*<br><br>(*ආ*) I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම ;<br><br>*සහ*<br><br>II. දකුණු ආසියාතික තරග, ආසියාතික තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය තරග නියෝජනය කර 1, 2, 3 ස්ථාන ලබා තිබීම ;<br><br>*හෝ*<br><br>ඔලිම්පික් තරග හෝ ලෝක ශූරතා තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර තිබීම. |

<table>
<tr>
<td></td>
<td>
*වයස් සීමාව :*<br><br>
අවම වයස අවුරුදු 18 වන අතර උපරිම වයස් සීමාව අවුරුදු 35කි.<br><br>
*විභාගය පිළිබඳ විස්තර :*
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය</th><th>කාලය</th><th>මුළු ලකුණු</th><th>සමත් ලකුණු</th></tr>
<tr><td>1. බුද්ධි පරීක්ෂණය :<br><br>අපේක්ෂයකයා සතු සාමාන්‍ය බුද්ධිය, ක්‍රීඩා පිළිබඳ සාමාන්‍ය දැනුම, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.</td><td>පැය 01</td><td>100</td><td>40%</td></tr>
<tr><td>2. භාෂා හැකියාව :<br><br>අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි</td><td>පැය 02</td><td>100</td><td>40%</td></tr>
</table>
</td>
</tr>
<tr>
<td>පරිවාස නිලධාරි - II</td>
<td>
(අ) අධ්‍යාපන සුදුසුකම් :<br><br>
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව, ජන සන්නිවේදන විද්‍යාව, සිංහල, අපරාධ විද්‍යාව, සමාජ දර්ශනය, මනෝ විද්‍යාව, මානව විද්‍යාව, සමාජ අධ්‍යයනය, සංවර්ධන අධ්‍යාපනය, ජනගහන විද්‍යාව, සාමය, වැටුප් නිරාකරණය හා පරිගණක විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් හෝ කිහිපයක් ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය/විශේෂ උපාධිය ලබා තිබීම.<br><br>
(ආ) වෘත්තීය සුදුසකම් - අදාළ නොවේ<br>
(ඇ) පළපුරුද්ද - අදාළ නොවේ.<br>
(ඈ) අවම වයස් සීමාව අවුරුදු 21<br>
උපරිම වයස් සීමාව අවුරුදු 35<br><br>
විභාගය පිළිබඳ විස්තර :
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය</th><th>කාලය</th><th>මුළු ලකුණු</th><th>සමත් ලකුණු</th></tr>
<tr><td>1. අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය :<br><br>භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි</td><td>පැය 01</td><td>100</td><td>40%</td></tr>
<tr><td>2. සාමාන්‍ය දැනීම :<br><br>ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සංස්කෘතික, විද්‍යාත්මක, ක්‍රීඩා ක්ෂේත්‍රයන් හි දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.</td><td>පැය 02</td><td>100</td><td>40%</td></tr>
</table>
</td>
</tr>
</table>

**පුස්තකාලයාධිපති III**

වයස් සීමාව අවුරුදු 22 ට නොඅඩු සහ 35 ට නොවැඩි වීම.

*අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* (i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා 3න් එකකට අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් තිබීම ;

*සහ*

(ii) ගණිතය සහ වෙනත් විෂයන් 2කට සම්මාන සහිතව විෂයයන් 6කින් අ.පො.ස. (සා.පෙ) විභාගය සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එකවර සමත්ව තිබීම ;

*සහ*

(iii) අ.පො.ස. (උ.පෙ) විභාගයේ දී ඕනෑම විෂයයන් 03ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 04කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ).

*වෘත්තීය සුදුසුකම් :*

*(ඉ)* (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාලයක් ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු උසස් ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම ;

*හෝ*

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත් ව තිබීම ;

*හෝ*

(iii) පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඉහත (i) හෝ (ii) සුදුසුකම්වලට වඩා ඉහළ සුදුසුකමක් ලබා තිබීම ;

**ඉහත අංක (ඉ) (iii) යටතේ සලකා බැලෙන සුදුසුකම්**

| *අධ්‍යාපන ආයතනයේ නාමය* | *පාඨමාලාවේ නාමය* | |
|---|---|---|
| කැලණිය විශ්වවිද්‍යාලය | i. | සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය (පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය) |
| කැලණිය විශ්වවිද්‍යාලය | ii. | විශේෂවේදී උපාධිය (පුස්තකාල හා විඥාපන විද්‍යාව) |
| කැලණිය විශ්වවිද්‍යාලය | iii. | පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති උපාධිය |
| කැලණිය විශ්වවිද්‍යාලය | iv. | පුස්තකාල හා විඥාපන විද්‍යා සාමාජීය විද්‍යාපති උපාධිය |
| කැලණිය විශ්වවිද්‍යාලය පශ්චාත් උපාධි පීඨය | v. | දර්ශන විශාරද (පුස්තකාල හා විඥාපන විද්‍යාව) |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | vi. | සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය (පුස්තකාල හා විඥාපන විද්‍යාව) |
| ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය (කොළඹ විශ්වවිද්‍යාලය) | vii. | ගුරු පුස්තකාලයාධිපතිත්ව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |

| | | |
|---|---|---|
| ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය (කොළඹ විශ්වවිද්‍යාලය) | viii. | ගුරු පුස්තකාලයාධිපතිත්ව ශාස්ත්‍රපති පාඨමාලාව |
| ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය (කොළඹ විශ්වවිද්‍යාලය) | ix. | පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය (කොළඹ විශ්වවිද්‍යාලය) | x. | දර්ශනපති/දර්ශන විශාරද (පුස්තකාල හා විඥාපන විද්‍යාව) |
| ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය (කොළඹ විශ්වවිද්‍යාලය) | xi. | තොරතුරු කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය (කොළඹ විශ්වවිද්‍යාලය) | xii. | තොරතුරු කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය |
| ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය (කොළඹ විශ්වවිද්‍යාලය) | xiii. | පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති උපාධිය |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | xiv. | පුස්තකාල හා තොරතුරු අධ්‍යයන ගෞරව ශාස්ත්‍රවේදී උපාධිය |

*විභාගය පිළිබඳ විස්තර :*

| | *ප්‍රශ්ණ පත්‍රය/විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 1. | පුස්තකාල හා විඥාපන විද්‍යාව | පැය 03 | 100 | 40% |
| 2. | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 3. | සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

ඉහත විෂයයන්ට අදාළ III ශ්‍රේණිය විවෘත තරග විභාගය විෂය නිර්දේශය පහත පරිදි වේ.

(1) **පුස්තකාල හා විඥාපන විද්‍යාව :**

(1) *පුස්තකාල හා පුස්තකාලාධිපතිත්වය*

(*අ*) පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය, පුරාතන හා නූතන ලෝකයේ ප්‍රධාන පුස්තකාල
(*ආ*) ලේඛන කලාවේ සහ පොත් ඇතුළු ලේඛන මාධ්‍යයන්හි ආරම්භය හා විකසනය,
(*ඇ*) මුද්‍රණ ශිල්පයේ ආරම්භය, ව්‍යාප්තිය සහ පුස්තකාල හා සමාජ සංවර්ධන විෂය කෙරෙහි බලපෑම
(*ඈ*) පුස්තකාල වර්ග

(i) විශේෂ පුස්තකාල

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා ආදී ආයතන ආශ්‍රිත පුස්තකාල, පර්යේෂණ පුස්තකාලවල ව්‍යුහය කාර්යභාරය හා සේවාවන්,

(ii) ශාස්ත්‍රීය පුස්තකාල

විශ්ව විද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන ආශ්‍රිත පුස්තකාලවල ව්‍යුහය, කාර්ය භාරය හා සේවාවන්,

(iii) මහජන පුස්තකාල

(ඉ) පුස්තකාල කමිටු ව්‍යුහය, අවශ්‍යතාව වැදගත්කම හා කාර්ය භාරය
(ඊ) පුස්තකාල වෘත්තියට අදාළ විද්වත් වෘත්තීය සංවිධාන හා ඒවායේ කාර්ය භාරය, ජාතික හා ජාත්‍යන්තර (ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇමරිකාව, බ්‍රිතාන්‍ය)
(උ) පුස්තකාල ගොඩනැගිලි - සැලසුම්කරණය, සලකා බැලිය යුතු කරුණු පවත්නා ගොඩනැගිල්ලක පුස්තකාලයක් ස්ථාපනය, සංවිධානය හෝ වැඩිදියුණු කිරීම
(ඌ) පුස්තකාල ද්‍රව්‍ය නඩත්තුව, සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)
(එ) ආපදා (Disasters) සහ ආපදා කළමනාකරණය

(II) *දැනුම සහ තොරතුරු සංවිධානය :*

(අ) ග්‍රන්ථ වර්ගීකරණයේ අරමුණු සහ ප්‍රයෝජන
(ආ) ශ්‍රී ලංකාවේ පුස්තකාලයන්හි භාවිතා වන ප්‍රධාන වර්ගීකරණ ක්‍රම, ඩිවි දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය
(ඇ) පුස්තකාල සූචියේ අරමුණු, ඇංග්ලො ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහ (AACR) සම්ප්‍රදාය
(ඈ) ග්‍රන්ථ විස්තරය
AACR 2 සංස්කරණය භාවිත කරමින් සංලේඛ සම්පාදනය

(III) *පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා :*

(අ) විවිධ පුස්තකාල සම්පත්
(ආ) එකතු සංවර්ධනය, එකතු සංවර්ධන ප්‍රතිපත්ති හා එහි වැදගත්කම
(ඇ) පුස්තකාල සම්පත් තේරීම ඇතුළු ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය

(i) පුස්තකාල සම්පත් තේරීමේ මූලධර්ම, මූලාශ්‍ර
(ii) ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය,පිරිසැකසුම්කරණය ඇතුළු විවිධ තාක්ෂණික සේවා
(iii) තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය

(ඈ) ප්‍රකාශනය, ප්‍රකාශන හිමිකම හා වාරණය
(ඉ) ප්‍රවර්තන සම්ප්‍රජානන සේවය
(ඊ) පාඨක අධ්‍යාපන වැඩසටහන්
(උ) මහජන සම්බන්ධතා සහ පුස්තකාල ප්‍රචාරණය

(IV) තොරතුරු සන්නිවේදන තාක්ෂණය (Information Communication Technology)

(අ) පුස්තකාලවල පරිගණකය භාවිතය හා පුස්තකාල සේවාවන් හා කාර්යයන් වලදී තොරතුරු තාක්ෂණයේ වැදගත්කම හා ඵලදායිතාව

(2) **බුද්ධි පරීක්ෂණය**

පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(3) **සාමාන්‍ය දැනුම**

ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුල මෙන්ම අප සමාජය තුල පවත්නා සාමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාල වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද පුස්තකාල විෂය හා පුස්තකාල

06. *විභාග ගාස්තු.-*

සෑම අයදුම්කරුවෙකු ම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 1200/- කි. (ඉල්ලුම් කරනු ලබන තනතුරු සංඛ්‍යාව අනුව වෙන වෙනම විභාග ගාස්තු ගෙවිය යුතු ය). එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

07. *අයදුම් කිරීමේ ක්‍රමය.-*

(*අ*) සියළුම අයදුම්කරුවන් www.psc.wp.gov.lk යන අපගේ නිල වෙබ් අඩවියට පිවිස අදාළ තොරතුරු ඇතුළත් කර අයදුම්පත පුරවා අයදුම්පත යොමු කිරීමෙන් අනතුරුව අයදුම්පත්‍රය භාගත කිරීම සිදුකළ හැකිය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

(*ආ*) අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. අයදුම්කරුවන් අත්සන සාමදාන විනිශ්චකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, (රු. 498,960/-ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු)බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවා ද සහතික කරවා ගත යුතු ය.

(*ඇ*) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2023.12.13** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ........................... ........................... බඳවා ගැනීමේ තරඟ විභාගය - 2023 (විවෘත) "** යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(*ඉ*) අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 07 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාග යේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

(*ඊ*) තනතුර සඳහා ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීම කිසිසේත්ම සිදුකළ නොහැකි අතර ඒ පිළිබඳ ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.

(*උ*) එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්කරනු ලබන තනතුර / තනතුරු අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය.

08. *විභාගයට ඇතුල්වීම.-*

(*අ*) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට

පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නිතීරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාවය.-

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය

10. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම.-

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

11. විභාග ක්‍රමය.-

(i) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.
(ii) මෙම විභාගය දන්වනු ලබන ඉදිරි දිනයකදී පවත්වනු ලැබේ.

12. බඳවා ගැනීමේ ක්‍රමය.-

ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව විවෘත ධාරාව යටතේ බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර තනතුරට බඳවා ගැනීමට අදාළ මූලික සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීමට පමණක් මෙය පවත්වනු ලැබේ.

13. මෙම විභාගවලින් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළකරනු ඇත.

14. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන / නොවන ඕනෑම කරුණක් පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

15. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

16. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළකර ඇත.

17. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2023 නොවැම්බර් මස 29 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2023 (විවෘත)*

විභාග අංකය [    ]

(කාර්යාලීය ප්‍රයෝජන සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E

[    ]

අයදුම් කරනු ලබන තනතුර / තනතුරු (අදාළ කොටුව /කොටු) තුළ හරි ලකුණ යොදන්න.

| *තනතුර* | |
|---|---|
| III පන්තියේ II ශ්‍රේණියේ බඳු නිලධාරි | |
| ක්‍රීඩා නිලධාරි III | |
| පරිවාස නිලධාරි - II | |
| පුස්තකාලයාධිපති III | |

01. 1.1 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -..........................................................................................

(*උදා.* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමග අගට යෙදෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :...........................................................................
.................................................................................................................................................

(*උදා.* : H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්)-...............................................................................................
.................................................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02. 2.1 ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ......................................................................................
.................................................................................................................................................

2.2 ස්ථිර ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්) : ...................................................................................................
.................................................................................................................................................

2.3 දුරකථන අංකය :

ස්ථාවර : | | | | | | | | | | |  ජංගම : | | | | | | | | | | |

* විභාගය සම්බන්ධ සියලු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මගින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න. (පසුව කරනු ලබන පැමිණිලි භාරගනු නොලැබේ.)

03 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

3.2 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - කොළඹ -1 ☐
ගම්පහ - 2
කළුතර - 3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..........................................................................................................................................

3.4 බස්නාහිර පළාතේ ස්ථිර ව පදිංචිව සිටින කාලසීමාව :..............................................................................................

04 4.1 විවාහක/අවිවාහක බව - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න.)

විවාහක : ☐ අවිවාහක : ☐

4.2 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

4.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

05. *අධ්‍යාපන සුදුසුකම් :*

5.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තරය :

i. විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය : | | | | | මාසය : | | |

ii. විභාග අංකය :.........................................................

iii. ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

5.2 *අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳව විස්තරය :*

i. විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐

ii. විභාග අංකය :.........................................................

iii. ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

5.3 *ලබා ඇති උපාධි සුදුසුකම් :*

i. උපාධියෙහි නම :.......................................................................................................................................

ii. උපාධිය ලබා ඇති විශ්වවිද්‍යාලය : ...........................................................................................................

iii. උපාධිය වලංගුවන දිනය :.........................................................

06. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 5.4 අනුව ලබා ඇති වෘත්තීය සුදුසුකම් : (නිවේදනයේ සඳහන් වෘත්තීය සුදුසුකම්වලට අදාළ අනු අංකය ඉදිරියෙන් සටහන් කරන්න.)

i) ...............................................................................................

ii) ..............................................................................................

07. දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින්නේ නම්,

7.1 දැනට දරන තනතුර : ..................................................................................................................................

7.2 සේවා ස්ථානයේ නම සහ ලිපිනය : ...............................................................................................................

7.3 එම තනතුරට පත්වීමේ දිනය : ......................................................................................................................

7.4 එම තනතුර ස්ථිරද, තාවකාලිකද, අනියම්ද යන්න : .......................................................................................

7.5 සේවය ස්ථිර කළ දිනය : ..............................................................................................................................

08. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.) ඔව් : ☐ නැත : ☐

"ඔව්" නම් විස්තර සඳහන් කරන්න : ..................................................................................................................

09. ලදුපත් ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :.......................................................................................
විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :.........................................................................................................
දිනය :...........................................................................................................................

| |
|---|
| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |

10. *අයදුම්කරුගේ සහතිකය :*

..........................................................................................................................................වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍යයැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ........................................................................................... තනතුරට පත්කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

..............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..........................

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන............................................................................................................................ මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය ...................................... වැනි දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

.....................................................,
අත්සන සහතික කරන්නාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය - ...................................................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම - ................................................
තනතුර - ..................................................................................................
ලිපිනය - .....................................................................................................

12. *රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................................................................................ මයා/මිය/මෙනවිය දැනට..................................................................................කාර්යාලයේ / ආයතනයේ............................ දින සිට මේ දක්වා ............................. ................................(තනතුර) වශයෙන් ස්ථිර /තාවකාලික/අනියම්(අනවශ්‍ය වචන කපා හරින්න) තනතුරක සේවය කරන බවද, ඔහුගේ /ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු /ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන බවද/නොකරන බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

.......................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය - ....................................................................................................
සහතික කරන නිලධාරියාගේ නම - ...................................................
තනතුර - ..................................................................................................
ලිපිනය - .....................................................................................................

12-195

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2023 වර්ෂය** | | | |
| **දෙසැම්බර්** | 2023.12.01 | සිකුරාදා | 2023.11.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.08 | සිකුරාදා | 2023.11.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.15 | සිකුරාදා | 2023.12.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.22 | සිකුරාදා | 2023.12.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.29 | සිකුරාදා | 2023.12.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2024 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2024.01.05 | සිකුරාදා | 2023.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.12 | සිකුරාදා | 2023.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.19 | සිකුරාදා | 2024.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.26 | සිකුරාදා | 2024.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2024.02.02 | සිකුරාදා | 2024.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.09 | සිකුරාදා | 2024.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.16 | සිකුරාදා | 2024.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.22 | බ්‍රහස්පතින්දා | 2024.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.